# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1828/31 – 2013 සැප්තැම්බර් 20 වැනි සිකුරාදා – 2013.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### මාතර දිස්ත්‍රික්කයේ කොටවිල පිහිටි කනංකදෙනිය වත්ත නමැති රජයේ ඉඩමේ තිබෙන පොල් ඵලදාව නෙලා ගැනීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම

1. මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති කනංකදෙනිය වත්ත නමැති රජයේ ඉඩමේ තිබෙන පොල් ඵලදාව 2013.11.04 දිනෙන් ඇරඹී 2014.11.03 දිනෙන් එක් අවුරුද්දක් අවසන් වන කාල පරිච්ඡේදය තුළ නෙලා ගැනීමේ අයිතිය මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් විසින් 2013.11.04 දින පෙ.ව. 10.00ට අදාළ ඉඩමේ දී වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. පොල් ගස් 255 සඳහා ආරම්භක ලංසුව රු. 214,000/-කි. එම අවම ලංසුවට ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

3. කිසියම් ලංසුවක් පිළිගැනීමට පෙර එම ලංසුව තැබූ තැනැත්තා වෙන්දේසිය පිළිබඳව කොන්දේසි පිළිගැනීමට එකඟ විය යුතුය.

4. සෑම ලංසු තබන්නකුම තමාම පැමිණ වෙන්දේසියට පෙනී සිටිය යුතුය. පැමිණිය නොහැකි නම් නියෝජිතයකු එවිය හැකි අතර ඔහු විසින් බලය පැවරීමේ ලිපි පරීක්ෂා කිරීම සඳහා වෙන්දේසියට පෙර වැලිගම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

5. පිළිගනු ලැබූ ලංසුකරුවන් විසින් තම ලංසුවෙන් හරි අඩක් වැලිගම ප්‍රාදේශීය ලේකම් වෙත එම අවස්ථාවේම ගෙවිය යුතුය. ඉතිරි කොටස වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ගෙවිය යුතුය. තෝරාගනු ලැබූ ලංසුකරුට ඉඩමේ භුක්තිය භාර දෙනු ලබන්නේ ලංසුවේ මුළු මුදල ගෙවූ පසු පමණි. ලංසුව පිළිගනු ලැබූ වහාම එම ලංසුවෙන් හරි අඩක් ගෙවීමට හෝ වෙන්දේසිය පැවැත්වූ දින සිට සති දෙකක් ඇතුළත ඉතිරි මුදල ගෙවීමට ලංසුකරු අසමත් වුවහොත් වෙන්දේසිය අවලංගු කොට යම් මුදලක් ගෙවා ඇතොත් එය රාජසන්තක කිරීමට ප්‍රාදේශීය ලේකම්ට අයිතිය තිබේ.

6. තෝරාගනු ලැබූ ලංසුකරු ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබූ යම් මුදලක් වෙතොත් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය.

7. තෝරාගනු ලැබූ ලංසුකරුට පහත සඳහන් කොන්දේසි ඇතුළත් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

(අ) බලපත්‍රලාභියාට ලිඛිත දැන්වීමක් මගින් මාසයක් කල් දී ප්‍රාදේශීය ලේකම් විසින් එම බලපත්‍රය ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැකිය.

(ආ) ඉඩම සම්බන්ධ සියලු වරිපනම් හා අය බදු ද තක්සේරුව හා වියදම් ද බලපත්‍රලාභියා විසින් ගෙවිය යුතුය.

(ඇ) බලපත්‍රලාභියා තාවකාලික, ස්ථිර හෝ ගොඩනැගිලි නොහොත් ඉදිකිරීම් කිසිවක් නොකළ යුතුය.

(ඈ) බලපත්‍රලාභියා විසින් ඉඩමේ ඇති සියලු මායිම් ගල් මනා තත්ත්වයෙන් තබා ගත යුතුය.

(ඉ) ඉඩමෙහි ඇති ගස් කොළන් කැපීම, ඉවත ගෙන යාම කවර ආකාරයකින් හෝ ඒවාට අලාභහානි සිදු කිරීම නොකළ යුතුය.

(ඊ) මෙම ඉඩමෙන් පස්, වැලි හෝ බොරළු හෝ වෙනත් ද්‍රව්‍ය ඉවතට ගෙන යෑම නොකළ යුතුය.

(උ) ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන මිස බලපත්‍රලාභියා විසින් තමාට ඇති අයිතිය පැවරීම අතුරු බදුදීම, උකස් කිරීම නැතහොත් වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ගණුදෙනු කිරීම නොකළ යුතුය.

(ඌ) ඕනෑම අවස්ථාවක ඉඩමට ඇතුළු වී පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හෝ ඔහු විසින් බලය පවරන ලද ඕනෑම නිලධාරියකුට පුළුවන.

(ඍ) බලපත්‍රය අවසන් වීමට පෙර ඉඩම සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් රජයට අවශ්‍ය වුවහොත් මසක් කල්දෙනු ලැබූ විට බලපත්‍රලාභියා විසින් එම සම්පූර්ණ ඉඩම නැතහොත් කොටස ප්‍රාදේශීය ලේකම්ට ආපසු භාර දිය යුතුය. එබඳු අවස්ථාවකදී ගෙවා ඇති බදු මුදලින් ප්‍රමාණානුකූල මුදලක් ආපසු ලබා ගැනීමටත් බලපත්‍රය නොගෙවී ඇති කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු බදු මුදල අඩු කරවා ගැනීමටත් හැකියාව ඇත.

(ඎ) බලපත්‍රලාභියා විසින් කොන්දේසි කඩකරනු ලැබුවහොත් කිසිම වන්දියක් නොගෙවා ඉඩමේ භුක්තිය වහාම ආපසු ගැනීමටත් ඇප මුදල සම්පූර්ණයෙන්ම හෝ කොටසක් රාජසන්තක කිරීමටත් ප්‍රාදේශීය ලේකම්ට අයිතිය ඇත.

(ඏ) බලපත්‍රලාභියා විසින් කරන ලද වැඩි දියුණු කිරීම් සඳහා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ රජයේ වන්දියක් ලැබීමට අයිතියක් නැත.

(ඐ) තාල වර්ගයට අයත් ඕනෑම ශාකයක් හෝ අමු කොළ සජීවී ශාක කොටස් අදාළ ඉඩමෙන් පිටතට ප්‍රවාහනය කිරීම කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ශාක ආරක්ෂක පනත යටතේ තහනම් බැවින් ලෙලි සහිත පොල් මෙම ඉඩමෙන් පිටතට ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

## උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොටවිල උතුර ග්‍රාම නිලධාරී වසමේ කොටවිල ගමේ පිහිටි මාතර මිනින්දෝරු අධිකාරිගේ අනුරේඛන අංක එම්ආර්/ඩබ්ලිව්එල්ජී2006/235 හි කැබලි අක්ෂර ඒ වලින් දැක්වෙන කොටස තුළ පිහිටි කනංකදෙනිය නමැති ඉඩම් කොටසේ ඵල දරන පොල් ගස් 255ක ඵලදාව වර්ෂයක කාලයක් සඳහා වෙන්දේසි කිරීම.

එම්. ලියනආරච්චි.
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2013 සැප්තැම්බර් මස 13 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.